# 12 දුම්රියෙන් ගමනක්






තාත්තේ, කෝච්චිය
කීයට ද ?

පුතා, කෝච්චියට
තව වෙලාව
තියෙනවා.

අපි කෑම කමු.

පුතා අත හෝදගන්න.

අම්මෙ, කෑමට ගෙනාවේ
මොනව ද?



ඉඳි ආප්ප යි, පරිප්පු යි,
සම්බෝල යි.

පුතා ඉක්මනට
කෑම කන්න.

“කරුණාවෙන් සවන්දෙන්න,

පළවෙනි වේදිකාවට දැන් පැමිණි යාල්දේවි දුම්රිය

පස්වරු 12.45ට යාපනය බලා පිටත් වේ.

එය යාපනය දක්වා සෑම දුම්රිය ස්ථානයක ම

නවත්වනවා ඇත.”



ඔන්න පුතා අපේ කෝච්චිය.

පුතා, ඉක්මන් කරන්න.

කෑම කොළ කූඩෙට දාන්න.

බෑග් අතට ගන්න.



නගින්න පුතා, නගින්න.

පරෙස්සමින් නගින්න.

## ✍ ක්‍රියාකාරකම 01

### වචන ගළපමු. කියවමු.

சொற்களை இணைப்போம். வாசிப்போம்.





අත්



කෑම



කුණුකූඩයට



නිවේදනයට



දුම්රියට

නගින්න

දාන්න

කන්න

සවන් දෙන්න

හෝදන්න

## ✍ ක්‍රියාකාරකම 02



### උපදෙස් කියවමු.

அறிவுரைகளை வாசிப்போம்.

i 

කෑමට පෙර අත් සෝදන්න.

ii 

කෑම කොළ කූඩෙට දාන්න.

iii 

කරුණාවෙන් සවන් දෙන්න.

iv 

බෑග් අතට ගන්න.

v 

පරෙස්සමෙන් නගින්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ✍ ක්‍රියාකාරකම 03

**සොයමු. කියවමු.**

தேடுவோம். வாசிப்போம்.

| |
|---|
| **යාපනයට, නිවේදනයට, 12.45, ඉඳිආප්ප, යාල්දේවි.** |



i අම්මා කෑමට ගෙනාවේ ................

ii මේ දුම්රියේ නම ................

iii දුම්රිය පිටත් වන්නේ ප.ව. ................

iv මේ දුම්රිය යන්නේ ................

v සවන් දෙන්නේ ................

## ✍ ක්‍රියාකාරකම 04

**වාක්‍ය හදමු. කියවමු.**

வசனங்களை அமைப்போம். வாசிப்போம்.



| |
|---|
| **කුඩෙට, අත, දුම්රියට, කෑම, අතට** |

i පුතා, ........................................ හෝදන්න

ii පුතා, ........................................ කන්න.

iii කෑම කොළ ........................................ දාන්න.

iv බෑග් ........................................ ගන්න.

v පරෙස්සමින් ........................................ නගින්න.

## ✍ ක්‍රියාකාරකම 05

ලියමු.

எழுதுவோம்.



| | | | |
|---|---|---|---|
| ක | - | කන්න | ක |
| කා | - | වේදිකාවට | කා |
| කැ | - | කැම | කැ |
| කී | - | කීයට ද? | කී |
| කු | - | කුණු | කු |
| කූ | - | කූඩෙ | කූ |
| කො | - | කොළ | කො |
| කෝ | - | කෝච්චිය | කෝ |
| ක් | - | ඉක්මනට | ක් |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# වචන මාලාව.

| | | |
|---|---|---|
| කරුණාවෙන් | - | தயவுசெய்து |
| සවන් දෙන්න | - | செவிமடுங்கள் |
| දුම්රිය | - | புகைவண்டி |
| ගමනක් | - | பிரயாணம் |
| වේදිකාව | - | மேடை |
| පළවෙනි | - | முதலாம் |

